


# සුපිරි පුතණ්ඩියා

UNEDITED SAMPLE PAGE

හා හා දැන් පටන් ගන්න බොත්තම ඔබන්න!



UNEDITED SAMPLE PAGE

# එක ට කලින් එක

නිල් පාට කොට කලිසම, කොළ පාට කමිසය... බෙල්ලේ ගැට ගහපු, කොණක ටී අකුර මහපු  රතු පාට පොරවන රෙද්ද...

හෝව් හෝව්! මොකක්ද ඒ ටී අකුර? ඒකෙන් මොකක්ද කියන්නේ?

අනේ කවුද දන්නේ? රෙද්ද මහපු කෙනාගේ නම පටන් ගන්න අකුර... එහෙම නැත්නම් ඒක රහසක් වෙන්නත් පුළුවන්! ඇත්තටම මොකටද ඕක ගැන වද වෙන්නේ? ඕපා දූප නැතුව කතාව කියවමු! යමු යමු!

ඔව් එතකොට දැන් කිව්ව රතුපාට රෙද්ද බෙල්ලේ ගැට ගහගෙන ඉන්න කොලු ගැටයා තමයි "**පුතාණ්ඩියා**" දවසකට වත් පුතාණ්ඩියා.


UNEDITED SAMPLE PAGE

"ඕන් ගුඩු ගුඩු...
උඩ උඩ උඩටම
පාවෙවී පාවෙවී...
එස්වාහ් පුහ්!"



පුතණ්ඩියා වේගයෙන් උඩ ගිහින්, අහස දෙසට පාවුණා. රතුපාට පොරවන රෙද්ද කුරුල්ලෙක්ගේ අත්තටු වගේ උඩට පහළට වැනෙනවා. එන්න එන්නම වේගය වැඩි වෙනවා... පුතණ්ඩියගේ කොණ්ඩේ එැණු ගෙඩියක් වගේ උඩට ඉස්සිලා... ආ නැහැ නැහැ ඒ සුළඟේ වේගයට නෙමෙයි, ජෙල් පොඩ්ඩක් ගාල කොණ්ඩේ හදල තියෙන්නේ... කොල්ලෙක් නේ! හැඩට ඉන්න එපැයි!

UNEDITED SAMPLE PAGE



"අන්න සුපිරි **පුතණ්ඩියා**!"

"අන්න අන්න පියාඹන **කොල්ලා**!"

මිනිස්සු පුතණ්ඩිය අහසේ ඉන්නවා දැකල උඩ බලාගෙන කෑ ගහන්න ගත්තා.

ඒක බලන්න ගිහින් සමහරු එකිනෙකාගේ ඇඟේ හැප්පුණා. තවත් සමහරු වළවල් වල වැටෙන්න ගියා. සමහරු කණු වල හැප්පුණා.

“අතපය කඩා ගන්නේ නැතුව එක තැනක ඉඳන් උඩ බලපල්ලා” එක මනුස්සයෙක් කෑ ගහල කිව්වා.

“අද මොකක්ද කලබලේ?”

“**මොකක්ද සිද්ද වෙලා තියෙන්නේ?**” ගිරිය කඩාගෙන අහස දෙසට කෑ ගහලා කෙනෙක් ඇහුවා.

“ආ මේ මුකුත් **නැහැ**! කිසි කලබලයක් **නැහැ**! මෙ... **මේමේමේමේමේ**...අලුත් **කතාවක් නේනේනේනේ**! කියවන අයට පොඩි පෙරහුරුවක් කරලා පෙන්නුවා” පුතණ්ඩියා උත්තර දුන්නා.

බෙල්ල කඩාගෙන උඩ බලාගෙන හිටපු මිනිස්සු ඔන්න බැණ බැණ යන්න ගියා.

UNEDITED SAMPLE PAGE

# 1

මාස දෙකකට කලින් පුතණ්ඩියා නිකන්ම නිකන් පුතණ්ඩියා. ඇඳ උඩ දිගා වෙලා එක කකුලක් බිත්තියේ තියාගෙන නිදාගෙන ඉන්නකොට,



UNEDITED SAMPLE PAGE

"පුතේ... පුතේ... මේ ළමයට කන් ඇහෙන්නේ නැද්ද?"

"**ළමයෝ**....... කම්මැලි කමට නිදාගෙන ඉන්නේ නැතුව නැගිටින**වා......** **ළමයෝ**..."

"**ග්ම්ම්**! තව පොඩ්ඩක්, විනාඩි පහක් ඉන්නම්."

"විනාඩි පහක් තියා තත්පරයක් වත් දෙන්න බැහැ, හොඳටම පරක්කු වෙලා... අද ඉස්කෝලෙ යන්නේ නැද්ද?"

"අද ඉස්කෝලෙ නොයා ඉන්න බැරිද?"

"මගෙන් ගුටි කන්න ඕනෙද?"

"පිටසක්වළින්වත් ඇවිත් මාව උඩට අරගෙන යන්නේ **නැහැනේ**...!"


"බලන් ඉඳින් එනකන් සක්වළෙන්!"

"වතුර එකක් ගහන්න කලින් නැගිටින්නයි **කිව්වේ...**"

UNEDITED SAMPLE PAGE

........................................................................

මේ වෙලාවේ ආලෝක වර්ෂ බර ගාණක් දුරින් පාවෙන පීරිසියක් තිබුණා. ඔව් හරියටම හරි පිටසක්වළ යානයක්. පෘථිවිය ගැන ඔත්තු බලන යානයක්.



UNEDITED SAMPLE PAGE

“▪≄ᘔ ♮∘ᘐ干ᘔ干▪≄ᘔ”

“▪≄ᘔ ▪干∘♮∘♮≄ᘔ ▪≄ᵖ”

“▪ḊḊḊ≄ᘔ”

“▪≄ᘔ干┐◡♩∘ ⁖ ▪≄ᵖ”

ආ ඔයාලට තේරෙන්නේ නැහැනේ! මේ පිටසක්වළ භාෂාව, ඔව් ඔව් පුතණ්ඩියා කියපු එක ඇහිලද කොහෙද. ඉන්න බලමු මොකක්ද පිටසක්වළයෝ කියන්නේ කියලා.

"කවුදෝ පිරිමි ළමයෙක් අපිට කතා කරනවා වගේ ඇහුණා."

"ඔව් ඔව් මටත් ඇහුණා"

"මොකද කියන්නේ! එක්කන් යමුද රවුමක්? හා හා හා..."

"ඕනේ නැහැ! කොල්ලා බයවෙයි."

"එහෙනම් අපි පොඩි විහිළුවක් කරමු."

"ඒ කිව්වේ?"

"අපි පොඩ්ඩක් කොල්ලව අහසේ පා කරලා බිමට බස්සමු."

"එහෙනම් කැප්ටන් ගන්න යානය ශ්‍රී ලංකාවේ, ↘⤫⌃∓⌒⌒----‴ ≭ť⌒♮Ť⌃ ♮≑⌒ťæ ∓ h́‴ ♮ණ⌃ මෙන්න මෙතැන තියන ගෙදර වහලේ උඩට."

"හරි ටකටුකා දවස් දෙකයි විනාඩි තුනකින් අපි එතැන. හරියටම මේ වෙලාවටම වගේ."

UNEDITED SAMPLE PAGE

# ඊළඟට පුතණ්ඩියට මොකක් වෙන්න ඇති ද?

සුපිරි පුතණ්ඩියට ආස ඔයාලට පුළුවන් ඊළඟට මොකද වුණේ කියල ඔයාලා හිතන විදිහ අපිට ලියල එවන්න.

අදහස් ලියල එවන ඔයාලට හරි අපූරු තෑගි ගෙදරටම ලැබෙනවා.

අපිට ලියන්න ඕන ලිපිනය,

**ත්‍රිමාණ ප්‍රකාශන**
**9, ජයගත් පාර,**
**නාවින්න,**
**මහරගම.**

ඉතින් ඔයාලා සුපිරි පුතණ්ඩියට වගේම සඳ උත්පලාවී නැන්ද ලියන කතා වලට කොච්චර ආසද කියල ලියලා එවන්නත් අමතක කරන්න එපා!

UNEDITED SAMPLE PAGE